# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1635 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 25/10/2024
පැය 0720

## මාධ්‍ය නිවේදනය

**ගිනි අවි 03 ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.23 වන දින සවස් කාලයේදී මාතර පොලිස් වසමේ පාලටුව ප්‍රදේශයේදී මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී ලෙස රිවෝල්වර් වර්ගයේ ගිනි අවි නිපදවනු ලබන ස්ථානයන් වටලා **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්, මිලිමීටර් 09 වර්ගයේ පතරොම් 05ක්, වෙල්ඩින් ප්ලාන්ට් 01 ක් සහ උපකරණ** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 63 ක් වන පාලටුව, මාලිම්බඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී මෙලෙස නිපදවූ ගිනි අවි 02 ක් මුදලට අලෙවි කර ඇති බවට අනාවරණය වී ඇති අතර, පසුව අහංගම පොලිස් වසමේදී මෙලෙස විකුණන ලද ගිනි අවි 02 සමඟ අවි මුදලට ගත් සැකකරුවන් දෙදෙනා මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 54 වයස්වල පසුවන අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සහ දේපල මාතර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර, මාතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**වැටලීමට අදාල ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත එවමි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**